රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2017(I)

මගේ අංකය : EST-6/03/LEA/3221-1
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.02.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## මදසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය රාජ්‍ය නිලධරයන්හට වැටුප් රහිත නිවාඩු ලබා දීම

2017.03.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2017 මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 22:9 උප වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමට 2020.12.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

> "22:9 ප්‍රසව හා නාරි විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශ මත රාජ්‍ය නිලධාරිණියන්ට මදසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට උපරිමය එක් (01) අවුරුද්දක් දක්වා දේශීයව හෝ විදේශීයව වැටුප් රහිත නිවාඩු අනුමත කළ හැකිය. අඹු සැමි යුවල වශයෙන් දෙදෙනාටම මදසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ප්‍රසව හා නාරි විශේෂඥ වෛද්‍ය නිර්දේශය ලබන අවස්ථාවල දී පිරිමි නිලධරයන් සඳහා මෙහි 22:1 උප වගන්තිය යටතේ වන මාස 03ක උපරිමයට යටත් අඛණ්ඩ කාලසීමාවක දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ද තවදුරටත් නිවාඩු අවශ්‍ය වන්නේ නම් අමතර දින 30ක උපරිමයකට යටත්ව ඛණ්ඩව හෝ අඛණ්ඩව දේශීයව හෝ විදේශීයව වැටුප් රහිත නිවාඩු ද ලබා දිය හැකිය."

03. මෙම විධිවිධාන 2020.12.14 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

මෙම රාජ්‍ය පරිපාලන / ...
ලිපිය ...
... අනුමැතිය 2021.01.02
දින ලබා දී ... ඔබ ... කරමි.
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / ...